තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## ආර්.එම්.එච්.ටී. රත්නායක එ. යටිනුවර ප්‍රාදේශීය සභාව

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 893/2019 (2019.05.13) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ආර්.එම්.එච්.ටී. රත්නායක
**නොතිසි ලත් පාර්ශවය**- නම් කල නිලධාරී, යටිනුවර ප්‍රාදේශීය සභාව

**පෙනීසිටීම**
අභියාචක - ආර්.එම්.එච්.ටී. රත්නායක
පොදු අධිකාරිය - ඩබ්ලිව්.ඒ.එල්.ටී. ජයරත්න- ලේකම්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.06.04 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.07.09 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.09.10 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:
අභියාචක විසින් 2018.06.04 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

සුසන්ත වීරක්කොඩි මහතා විසින් ඉදිකරන ලද අනවසර ඉදිකිරීමක් සම්බන්ධව,

1.
   a. ඉහත ඉදිකරගෙන යා ගොඩනැගිල්ල සඳහා සුසන්ත වීරක්කොඩි මහතා ප්‍රාදේශීය සභාවේ නිසි අනුමැතිය ලබා ගෙන ඇතිද?
   b. අදාළ ගොඩනැගිල්ලේ සැලසුම පොදු අධිකාරිය අනුමත කර ඇතිද?
2. මෙම ඉදිකිරීම අප ඉඩමට හාදාවන බව සඳහන් කරමින් කල්‍යාණවතී ජයසුන්දර මහත්මිය 2001 වසරේ සිට පොදු අධිකාරියට කී වරක් පැමිණිලි කර ඇතිද?
3.
   a. එම ඉදිකිරීම තහනම් කරමින් පොදු අධිකාරිය විසින් 2001 වසරේ සිට මේ දක්වා කී වරක් සුසන්ත වීරක්කොඩි මහතා වෙත ලිඛිත දැනුම් දීම් කර ඇතිද?
   b. එම දිනයන් මොනවාද?
   c. 2002 වසරේ සිට මෙම අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට පොදු අධිකාරිය ගත් ක්‍රියාමාර්ග මොනවාද?
4. මෙම අනවසර ඉදිකිරීමට අනතුරුදායක බව පවසා 2002.02.22 වන දින සිට පොදු අධිකාරිය මින් පෙර අප ඉඩම මායිමේ පිහිටි ගස් කොපමණ ප්‍රමාණයක් කොපමණ වාරයක් තුළ ඉවත්කරදී ඇතිද?
5. පොදු අධිකාරිය විසින් මහනුවර අතිරේක මහේස්ත්‍රාත් මඟින් නඩු අංක 24563 ට ලබා දුන් තීන්දුවේ ඇල්ල සේදීයන ක්‍රියාවන් සිදුකිරීම තහනම් කරමින් දුන් තීන්දුවට එරෙහිව අංක සීපීසී/වයිපීඑස්/3/4/1 සහ 2016.12.28 දින දරන ලිපියෙන් දිසා අධිකරණයේ රෙජිස්ටාර්වරයා වෙත කරන ලද ඉල්ලීමට ලද පිළිතුර කුමක්ද?
6. එම ලිපිය යොමු කිරීමේදී 2010.08.31 නඩු තීන්දුව ලබා දී ඇති සහ එම තීන්දුවේ පිටපතක් පොදු අධිකාරිය සතුව තිබියදී දැනට පවතින නඩුවක් ලෙස සලකා රාජකාරී කිරීමට පොදු අධිකාරියට පළාත් පාලන හෝ වෙනත් පනතක් අනුව ලබා දී ඇති නීතිමය ප්‍රතිපාදන මොනවාද?
7.
   a. අප විසින් යම් හෙයකින් මානුෂීය හේතු සලකා බලා මෙම ගස ඉවත් කරන්නේ නම්, ඒ සඳහා වන අධිකරණ අනුමැතිය පොදු අධිකාරියට ලබා දිය හැකිද?
   b. සුසන්ත වීරක්කොඩි මහතා විසින් තවදුරටත් අප ඉඩම බලෙන් අත්පත් කරගැනීමට මෙම ගස ඉවත් කිරීම අනියම් ආකාරයේ උපකාරයක් වුවහොත් අපට වන අලාභය පියවා දීමට පොදු අධිකාරියට නීතිමය හැකියාව තිබේද?

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.07.09 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.09.10 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පාර්ශව දෙකම පැමිණ සිටිති. පිළිතුරක් යවා ඇති බව කොමිසමට දන්වා ඇත. තුන්වැනි පාර්ශවයෙන් විමසා බලා කටයුතු කළ යුතු බව දන්වා ඇත.

**නියෝගය:**

අභියාචනය කල් තබන ලදී.
මීළඟ දිනය 2019.08.26 ප.ව.12:30
කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

---

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 893/2019 (2019.08.26) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**පෙනීසිටීම**

අභියාචක -ආර්.එම්.එච්.ටි. රත්නායක
පොදු අධිකාරිය - ඩබ්ලිව්.ඒ.එල්.ටි. ජයරත්න- ලේකම්

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

කලින් වාරයේ එය තුන්වැනි පාර්ශ්වයේ කැමැත්ත විමසා බලන බවට පොදු අධිකාරිය පැවසීය.
එම ගොඩනැගිලි සැලැස්මේ පිටපතක් දීමේ අපහසුතාවයත්, තුන්වැනි පාර්ශවයේ අකමැත්තත් නිසා ඉල්ලීම ඒ පරිද්දෙන්ම ඉටු කළ නොහැකිය. එහෙත් එම සැලැස්ම

අභියාචකට බැලීමට ඉඩ සලසන ලෙස නියෝග කරන ලදී. යොදා ගත් දිනයක එසේ කළ යුතුය. නියෝගය ලැබුණු පසු එසේ ඉඩ සැලසීමට එකඟ වේ. ගොනුවේ කටයුතු එසේ කළ බව දැන්වීමෙන් පසු නිම වේ.

**නියෝගය:**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්ද, 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් නොවන හෙයින්ද, එම ඉල්ලීමට අදාළ තොරතුරු බැලීමට නියෝග කළ බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.